# අපරාධ පාලනය හා නිවාරණය කෙරෙහි නිරීක්ෂණ පද්ධතීන්හි ඇති බලපෑම පිළිබඳ අධ්‍යයනයක් (අස්ගිරි-වල්පොල ග්‍රාමසේවා වසම ඇසුරින්)

ජී. ඒ. එස්. පෙරේරා[1], බී.වී.එන්. විජේවර්ධන[2]

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අපරාධ පාලනය හා නිවාරණය පිළිබඳ ව අභියෝගවලට මුහුණ දෙමින් පවතින කාල වකවානුවක පාරිසරික සැලසුම් මඟින් අපරාධ වැළැක්වීම පිළිබඳ ව සැලකිය යුතු අවධානයක් ලබාදී ඇත. අපරාධ පාලනය සහ නිවාරණය සඳහා පාරිසරික නිර්මාණයන්ගේ බලපෑම සමාජ ගතිකත්වය හා මානව හැසිරීම් ක්ෂේත්‍රය දක්වා විහිදෙන්නා වූ සංකල්පයකි. මෙම පර්යේෂණය අපරාධ පාලනය හා නිවාරණය කෙරෙහි නිරීක්ෂණ පද්ධතීන්හි බලපෑම විමර්ශනය කරයි. පාරිසරික සැළසුම් හරහා අපරාධ වැළැක්වීමේ (Crime Prevention Through Environmental Design - CPTED) මූලධර්මයෙහි එන උපායමාර්ගිකව නිර්මාණය කරන ලද භෞතික අවකාශයන් තුළ දැකිය හැකි නිරීක්ෂණ පද්ධති (CCTV) මඟින් අපරාධ ක්‍රියාවන් වැළැක්විය හැකිද, නිවැසියන් අතර ආරක්ෂාව පිළිබඳ හැඟීමක් වර්ධනය කළ හැකිද, ප්‍රජාවගේ ආරක්ෂාවට දායක විය හැකිද යන්න පිළිබඳ ව ගවේශණය කරයි.

සාහිත්‍ය විමර්ශනයෙන් පෙනී යන්නේ පාරිසරික සැළසුම් හරහා අපරාධ වැළැක්වීමේ මූලධර්මය අපරාධ පාලනය සහ වැළැක්වීම සඳහා වටිනා ප්‍රවේශයක් ඉදිරිපත් කරන බවත්, ගොඩනගන ලද පරිසරය උපක්‍රමශීලීව හැඩගැස්වීමෙන්, ප්‍රජාවන්ට සාපරාධී ක්‍රියාකාරකම් වැළැක්විය හැකි අතර පදිංචිකරුවන්ට වැඩි ආරක්ෂාවක් පිළිබඳ හැඟීමක් ඇති කළ හැකි බවත්ය. පාරිසරික සැලසුම් හරහා අපරාධ වැළැක්වීම (Crime Prevention Through Environmental Design - CPTED) යනු ගොඩනගන ලද පරිසරය සහ අපරාධ අනුපාත අතර සම්බන්ධය ගවේෂණය කරන ලද ප්‍රවේශයකි (Cozens et al., 2017). CPTED (Crime Prevention Through Environmental Design) මූලධර්මය ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් කෙරෙහි අවධානය යොමු කරයි. එනම්; භෞමිකත්වය, නිරීක්ෂණ, ප්‍රවේශ පාලනය සහ ක්‍රියාකාරකම් සහාය වේ (Crowe, 2000). භෞමිකත්වය පැහැදිලි හිමිකාරිත්වයක් ස්ථාපිත කරන අතර නිවැසියන් ඔවුන්ගේ වටපිටාව ගැන ආඩම්බර වීමට දිරිමත් කරයි (Cozens et al., 2017). සුපරීක්ෂාකාරීත්වය නිසි ආලෝකකරණය, විවෘත දර්ශන මාර්ග සහ නිවැසියන් පොදු අවකාශයන් භාවිතා කිරීම දිරිමත් කිරීම හරහා ස්වභාවික අධීක්ෂණය ප්‍රවර්ධනය කරයි (Crowe, 2000). ප්‍රවේශ පාලනය සාපරාධී ක්‍රියාකාරකම් අධෛර්යමත් කළ හැකි, ඇතුල්වීමේ සහ පිටවීමේ ස්ථාන නියාමනය කරයි (Cozens et al., 2017). ක්‍රියාකාරකම් සහාය සැලසුම් කිරීම සහ ක්‍රමලේඛනයට

1. අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ.
2. අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ.
pererashamika247@gmail.com

ආරාධනා කිරීම, ප්‍රජාව පිළිබඳ හැඟීමක් ඇති කිරීම සහ නීත්‍යානුකූල පරිශීලකයින් වැඩි වශයෙන් සිටීම තුළින් අපරාධ අධෛර්යමත් කිරීම හරහා පොදු අවකාශයන් භාවිතය ප්‍රවර්ධනය කරයි (Crowe, 2000). පැහැදිලි භෞමිකත්වය සහ ආරක්ෂිත අවකාශ සැලසුම හිමිකාරීත්වය සහ ප්‍රජාව පිළිබඳ හැඟීමක් ඇති කළ හැකිවන අතර, අපරාධ සඳහා ඇති අවස්ථා අඩු කරයි (Newman, 1972). උපායමාර්ගිකව ක්‍රියාත්මක නොකළහොත් CPTED (Crime Prevention Through Environmental Design) මූලධර්මය අපරාධ වෙනත් ප්‍රදේශවලට විස්ථාපනය කළ හැකි ය (Cozens et al., 2017). තව ද, නිර්මාණ විසඳුම් උපරිම සඵලතාවය සඳහා භෞතික සාධක සමඟ සමාජ හා ආර්ථික සාධක සලකා බැලිය යුතු ය (Brown, 1995).

මෙවන් පසුබිමක් තුළ මෙම පර්යේෂණයයේ පර්යේෂණ ගැටලු වන්නේ ශ්‍රී ලංකාව තුළ විවිධ වූ අපරාධ බහුලව සිදුවන අවස්ථාවක නිරීක්ෂණ පද්ධති (CCTV) මඟින් අපරාධ පාලනය හා නිවාරණය සිදුකළ හැකිද? නිරීක්ෂණ පද්ධති අපරාධ පාලනය හා නිවාරණයට කෙතරම් දුරට බලපාන්නේද? ශ්‍රී ලංකාව තුළ ප්‍රජා ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා ග්‍රාමීය පරිසරයන්හි නිරීක්ෂණ පද්ධති ස්ථාපනය කළ හැක්කේ කෙසේද? යන්නයි. තෝරාගත් ප්‍රදේශයේ අපරාධ ප්‍රවණතාත් ඒ සඳහා නිරීක්ෂණ පද්ධතීන්හි ඇති බලපෑම අධ්‍යයනය කිරීම, ඒ තුළින් අපරාධ ප්‍රවණතා අවම කර ගැනීමට යෝජනා ඉදිරිපත් කිරීම අරමුණ වේ.

පර්යේෂණයේ වැදගත්කම CPTED (Crime Prevention Through Environmental Design) මූලධර්මය ක්‍රියාත්මක කිරීමේ හැකියාව, තිරසාරත්වය, නඩත්තු කිරීමේ හැකියාව, ප්‍රජා සහභාගීත්වය, සමාජ සම්බන්ධතා වර්ධනය, ගැටුම් නිරාකරණයේ හැකියාව, ආරක්ෂාව පිළිබඳ දැනුම ලබා දීම, සමාජ ඒකාබද්ධ කිරීමේ හැකියාව, නිසි ලෙස ප්‍රතිචාර දැක්වීමට ඇති හැකියාව දැක්විය හැකි ය.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය අස්ගිරි-වල්පොල ග්‍රාමීය ජනතාව අතර අපරාධ පාලනය හා නිවාරණය සඳහා නිරීක්ෂණ පද්ධතීන් (CCTV) දායකවන ආකාරය ගවේෂණය කිරීම සඳහා ගුණාත්මක පර්යේෂණ සැලසුමක් යොදාගනී. මේ සඳහා සහයෝගය දුන් ග්‍රාමීය ජනතාවගේ අත්දැකීම් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට සිද්ධි අධ්‍යයන ප්‍රවේශයක් තෝරාගනු ලැබීය. මෙම ජනගහනය තුළ අපරාධ පාලනය හා නිවාරණය පිළිබඳ ව අධ්‍යයනය කිරීමට CPTED (Crime Prevention Through Environmental Design) සංකල්පය භාවිතා කරන ලදි.

අධ්‍යයනය සඳහා අස්ගිරි-වල්පොල ග්‍රාමසේවා වසමේ සමස්ත පවුල් 527ක් හඳුනාගෙන ඇති අතර මෙයින් පවුල් 30ක් තෝරාගනු ලැබුවේ අරමුණු සහිත නියැදියක් භාවිතා කරමිනි. මෙහි දී මෙම නියැදියේ අධ්‍යාපන මට්ටම, ආර්ථික මට්ටම මෙන් ම අපරාධ සඳහා ගොදුරු වීමේ අත්දැකීම් මත තෝරා ගන්නා ලදි.

නිරීක්ෂණ, අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා මඟින් දත්ත රැස් කළ අතර සම්මුඛ සාකච්ඡා සඳහා සහභාගී වන්නන්ගේ කැමැත්ත ඇතිව ශ්‍රව්‍ය පටිගත කිරීම් කරන ලදි. නිරීක්ෂණ අතරතුර සවිස්තරාත්මක ක්ෂේත්‍ර සටහන් ලබා ගන්නා ලදි.

සෑම සම්මුඛ සාකච්ඡාවක්ම මිනිත්තු 60 සිට 80 දක්වා පැවති අතර ග්‍රාමයේ සිදුවන අපරාධ පිළිබඳ ව, ඒවා වලක්වා ගැනීමට යොදාගෙන ඇති උපක්‍රම, CPTED (Crime Prevention Through Environmental Design) සංකල්පය පිළිබඳ ව මොවුන් තුළ ඇති ආකල්ප වැනි මාතෘකා ආවරණය කරන ලදී.

සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ මඟින් එකතු කරගනු ලැබූ දත්ත තේමාත්මක විශ්ලේෂණය භාවිතයෙන් විශ්ලේෂණය කරන ලද අතර සම්මුඛ සාකච්ඡා වාචිකව පිටපත් කරන ලදී.

ග්‍රාමයේ සිදුවන අපරාධ, ඒවා පාලනය හා නිවාරණයට ගෙන ඇති පියවර, CPTED (Crime Prevention Through Environmental Design) සංකල්පය පිළිබඳ ව ජනතාව තුළ ඇති දැනුම හා ආකල්ප වැනි තේමා අපරාධ පාලනය හා නිවාරණය සඳහා නිරීක්ෂණ පද්ධතීන්හි බලපෑම පිළිබඳ ව විමර්ශනය කරන ලදී.

දත්ත දායකයින්ට ඔවුන්ගේ අත්දැකීම් බෙදා ගැනීම සඳහා නම්‍යශීලී වීමට අවස්ථාව ලබා දුන් අතර අර්ධ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මාර්ගෝපදේශ දත්ත රැස් කිරීමේ මෙවලම් ලෙස භාවිතා කරන ලදී.

**ප්‍රතිඵල/ සොයාගැනීම් සහ සාකච්ඡාව**

මෙම පර්යේෂණය අපරාධ පාලනය සහ නිවාරණය සඳහා පාරිසරික සැලසුමේ බලපෑම භෞතික වටපිටාව සහ අපරාධ හැසිරීම් අතර සම්බන්ධය පිළිබඳ සැලකිය යුතු අවබෝධයක් ලබා දෙයි.

අධ්‍යයනවලින් පෙනී යන්නේ භෞමිකත්වය, ස්වාභාවික නිරීක්ෂණ සහ ප්‍රවේශ පාලනය යන CPTED (Crime Prevention Through Environmental Design) මූලද්‍රව්‍ය අපරාධ සඳහා ඇති අවස්ථා අඩු කළ හැකි බව යි. ආලෝකකරණයක් සහිත හොඳින් නඩත්තු කරන මෙන් ම නිරීක්ෂණ පද්ධති ඇති පරිසරයන් සහ එළිමහන් ස්ථාන අපරාධ ක්‍රියාකාරකම් අඩු කරයි. හොඳින් සැලසුම් කරන ලද පරිසරය නිවැසියන් අතර හිමිකාරිත්වය සහ නිරීක්ෂණ පිළිබඳ හැඟීමක් ඇති කිරීම මගින් අපරාධ වැළැක්වීමක් සිදු වේ.

අපරාධ බිය කෙරෙහි නිරීක්ෂණ පද්ධතීන්හි ධනාත්මක බලපෑම පර්යේෂණය අවධාරණය කරයි. ආරක්ෂිත සහ ආරක්ෂිත යැයි හැඟෙන පරිසරයන් නිර්මාණය කිරීමෙන්, නිවැසියන් පොදු අවකාශයන් භාවිත කිරීමට, සමාජ අන්තර්ක්‍රියා සහ ප්‍රජා ඒකාබද්ධතාවය පෝෂණය කිරීමට වැඩි ඉඩක් ඇත. මේ පිළිබඳ පහත දක්වා ඇති රාමු අංක 3.1 මඟින් දක්වා ඇත.

<table>
<tr><td>රාමු අංක 3.1.</td><td></td></tr>
<tr><td colspan="2">වයස අවුරුදු 52ක කාන්තාවකගේ ප්‍රකාශය<br>"ඉස්සර අපේ වත්තේ හරියට පොල් හොරකම් වුණා. ඒ දවස්වල CCTV තිබ්බේ නැහැ. හොරා කවුද කියලා හොයා ගන්නත් බැරි වුණා. හැබැයි දැන් ගෙදර වටේටම CCTV දාලා තියෙන්නේ. ඒ නිසා දැන් හොරකම් වෙන්නේ නැහැ. හොරු බයයි CCVT නිසා."<br>කාන්ති අවුරුදු 52ක කාන්තාවක්<br>(නම මනඃකල්පිතයි)</td></tr>
</table>

CPTED (Crime Prevention Through Environmental Design) හුදකලා විසඳුමක් නොවන අතර අනෙකුත් අපරාධ වැළැක්වීමේ උපාය මාර්ග සමඟ ක්‍රියාත්මක කළ යුතු ය. ග්‍රාමීය සැලසුම්කරණය සහ වාස්තු විද්‍යාත්මක පිළිවෙත්වලට පාරිසරික සැලසුම් හරහා අපරාධ වැළැක්වීමේ (Crime Prevention Through Environmental Design - CPTED) මූලධර්ම ඇතුළත් කිරීමේ වැදගත්කම පර්යේෂණය මගින් ඉස්මතු කරයි. CPTED (Crime Prevention Through Environmental Design) සංකල්පයන් උපරිම කිරීම සඳහා උපක්‍රමශීලීව අවකාශයන් සැලසුම් කිරීමෙන්, අපරාධ හැසිරීම් සඳහා අඩු හිතකර පරිසරයක් ගම් තුළ නිර්මාණය කළ හැකි ය. මෙයට සෘඛධ සවි කිරීම, ආරක්ෂිත පිවිසුම් ස්ථාන ක්‍රියාත්මක කිරීම සහ පොදු අවකාශයන්හි දෘශ්‍යතාව වැඩි කිරීම වැනි ක්‍රියාමාර්ග ඇතුළත් විය හැකි ය. මේ පිළිබඳ ව රාමු අංක 3.1 මඟින් දක්වා ඇත.

| රාමු අංක 3.2. | |
|---|---|
| *වයස අවුරුදු 30ක තරුණයකුගේ ප්‍රකාශය*<br>*"CCTV ඇත්තටම හොඳයි. ඒක අපේ ආරක්ෂාවට වගේම වටපිටේ ඉන්න නෑදෑයගේද ආරක්ෂාවට වටිනවා. තාක්ෂණය යොදාගෙන පරිසර නිර්මාණය කිරීමෙන් ඇත්තටම අපරාධ පාලනයක් කර ගන්න පුලුවන්. මේ ලේන් එක ඉස්සර හරියට හොරකම් වෙන පැත්තක්. හැබැයි මේ CCTV දාලා, ආලෝකකරණය කළාට පස්සෙ දැන් හොරකම් අඩු වෙලා."*<br>*වමත් අවුරුදු 30ක තරුණයෙක්*<br>*(නම මනඃකල්පිතයි)* | |

තව ද, ගොඩනැගූ පරිසරය හැඩගැස්වීමේදී ප්‍රජා සහභාගීත්වයේ කාර්යභාරය අධ්‍යයනය අවධාරණය කරයි. ඔවුන්ගේ අසල්වැසි ප්‍රදේශ සැලසුම් කිරීම, නඩත්තු කිරීම සඳහා පදිංචිකරුවන් සම්බන්ධ කරගැනීම හිමිකාරිත්වය පිළිබඳ හැඟීමක් ඇති කරනවා පමණක් නොව, දේශීය අවශ්‍යතා සහ මනාපයන් අනුව සකස් කරන ලද ඵලදායී අපරාධ වැළැක්වීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට පහසුකම් සපයයි.

CPTED (Crime Prevention Through Environmental Design) මූලධර්ම ඇතුළත් කිරීමෙන්, ප්‍රජාවන්ට ආරක්ෂිත අවකාශයන් නිර්මාණය, අපරාධ පිළිබඳ බිය අඩු කිරීමට සහ ප්‍රජාව පිළිබඳ ශක්තිමත් හැඟීමක් පෝෂණය කිරීමට හැකි ය. නිර්මාණාත්මක මැදිහත්වීම් සමඟ සමාජ හා ආර්ථික සාධක සලකා බලන බහුවිධ ප්‍රවේශයක් කල්පවත්නා අපරාධ අවම කිරීමට වැදගත්ය.

**නිගමනය**

පාරිසරික සැලසුම් හරහා අපරාධ වැළැක්වීම පිළිබඳ පර්යේෂණ අපරාධ අනුපාත සහ ආරක්ෂාව පිළිබඳ සංජානනය හැඩගැස්වීමේදී ගොඩනැගූ පරිසරය සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන බවට සාක්ෂි සපයයි. අපරාධ පාලනය, නිවාරණය අපරාධ යුක්ති ක්‍රමයට පමණක් සීමා වන්නක් නොව. එය සමස්ත සමාජයටම විවෘත වන්නකි (විජේවර්ධන, 2022). CPTED (Crime Prevention Through Environmental Design)

මූලධර්ම තුළ ඇති නිරීක්ෂණය ක්‍රියාත්මක කිරීමෙන්, ප්‍රජාවන්ට අපරාධ ක්‍රියාකාරකම් වැළැක්විය හැකි ය, නිරීක්ෂණ පද්ධති දියුණු කළ හැකි ය, පදිංචිකරුවන් අතර හිමිකාරිත්වය පිළිබඳ ශක්තිමත් හැඟීමක් පෝෂණය කළ හැකි ය. අධ්‍යයනවලින් පෙන්නුම් වන්නේ වැඩිදියුණු කළ ආලෝකකරණය, පැහැදිලි දර්ශන සහ හොඳින් නඩත්තු කෙරූ අවකාශයන් අපරාධ සඳහා ඇති අවස්ථා සැලකිය යුතු ලෙස අඩු කළ හැකි බව යි.

CPTED (Crime Prevention Through Environmental Design) මූලධර්මය ස්වාධීන විසඳුමක් නොවන අතර සමාජ ආර්ථික සාධක, සමාජ වැඩසටහන් ද අපරාධවලට හේතු සොයා බැලීමේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ප්‍රජාවක නිශ්චිත සන්දර්භය සැලකිල්ලට ගනිමින් CPTED (Crime Prevention Through Environmental Design) මූලධර්මය කල්පනාකාරීව ක්‍රියාත්මක කළ යුතු ය. නුසුදුසු ලෙස යෙදීමෙන් අපරාධ වැඩි වීම වැනි ප්‍රතිඵල ලැබිය හැකි ය.

**යෝජනා**

CPTED (Crime Prevention Through Environmental Design) මූලධර්ම ග්‍රාමීය සැලසුම්කරණය, වාස්තු විද්‍යාත්මක භාවිතයන් වෙත ඒකාබද්ධ කිරීමට අවධානයක් දිය යුතු ය. අධ්‍යාපනික වැඩසටහන් මඟින් ආරක්ෂාව සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කරන අවකාශයන් සැලසුම් කිරීමට දැනුමෙන් වෘත්තිකයන් සන්නද්ධ කළ හැකි ය. ප්‍රජා සාමාජිකයින්, නීතිය ක්‍රියාත්මක කරන්නන් සහ නිර්මාණ විශේෂඥයින් අතර සහයෝගීතාවය වර්ධනය කළ යුතු ය. නිරීක්ෂණ පද්ධති (CCTV} වැඩිදියුණු කිරීම සමඟ පාරිසරික සැලසුම් ඒකාබද්ධ කරන විස්තීරණ ප්‍රවේශයක් භාවිතා කිරීමෙන් ප්‍රජාව සඳහා වඩාත් ආරක්ෂිත සහ වඩාත් ජීවත්විය හැකි අවකාශයන් නිර්මාණය කළ හැකි ය.

**මූඛ්‍ය පදඃ** අපරාධ, අපරාධ පාලනය හා නිවාරණය, නිරීක්ෂණ පද්ධති, පරිසර නිර්මාණය, CPTED

**ආශ්‍රිත ග්‍රන්ථ**

විජේවර්ධන. එන්. (2022). 'සංස්කෘතිය, අපරාධ පාලනය හා නිවාරණය', සංස්කෘතික අපරාධ විද්‍යාව, 22. http://fhss.sjp.ac.lk/criminology/ (ප්‍රවේශයඃ 2023 මැයි 22).

Brown, M., (1995). *Security by design*: evaluating crime prevention through environmental design.

Cozens, P., Farrington, D., and Pease, K., (2017). 'Crime Prevention Through Environmental Design', in Tonry, M. (ed.) *The Oxford Handbook of Criminology*. 7th edn. Oxford: Oxford University Press, pp. 1-23.

Crowe, T.D., (2000). *Crime prevention through environmental design*. Washington, DC: National Institute of Justice, Office of Justice Programs, U.S. Department of Justice.

Eisen, M., and Rand, G.M., (2000). *Community policing and crime*. Washington, DC: National Institute of Justice, Office of Justice Programs, U.S. Department of Justice.